IB DIPLOMA PROGRAMME
PROGRAMME DU DIPLÔME DU BI
PROGRAMA DEL DIPLOMA DEL BI

M04/149/S(1)

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1**
**CINGALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1**
**CINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1**

Monday 10 May 2004 (afternoon)
Lundi 10 mai 2004 (après-midi)
Lunes 10 de mayo de 2004 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.

**පහත දැක්වෙන පේද අතුරින් එකක් සඳහා විවරණයක් සපයන්න.**

1 (අ)

# නැළවිල්ල

තොටිල්ල සැම සුව පි රි
පැද්දෙයි තාලෙට ස රි
අසමින් ගී සුමිහි රි
නිදන්නැ පුත රන් කි රි

දෙයි දෙයි දෙ යි
බයි බයි බ යි
නිදි මව එ යි
වැලැඳ ගනි යි

උණු වැඩි යැ යි හිරු ගෙ ර ස්
තෙමා නැවැතැ ගෙනෙන ලෙ ස්
ගියේ යැ වැඳ මුහුදු කු ස්
පෙනේ ද ආදර වෙසෙ ස්

සිහිල් වෙති යි සඳ ඉ තා
සාවා එහි පැනැ ග තා
රැසින් අඩක් නො නව තා
සිටී ද ඒ හොඳ ස තා

සුරතල් දරු බිය වෙ ති
කුරුලු පැටවු නො හඬ ති
නැළැවිල්ලෙන් කම් නැ ති
කිරිල්ලෝ ද සැතැපෙ ති

වඳු පැටියෝ ගෙල ප සා
මිණි වැල් සෙලැවෙන නි සා
රිසි ලෙස ඇඟ නො ම ක සා
හිඳිති තණට ඇස ව සා

සර සර ගානා ත    දේ
ගසුත් සුළඟ වැද ම    දේ
දූත් නො ම කැර කිසි ස    දේ
අතු අතරින් ගමන    දේ

ගඟ ද සුළඟ සමඟි    නී
කතා නො කැර පෙර මෙ    නී
හබල් පහර ඔරුයෙ    නී
නිසොල්මන් වැ විදැ ග    නී

සඳපානෙන් වැලි ත    ලා
සුර කුමරියො මල් ස    ලා
නටති මෙ දෙස බලබ    ලා
ගිගිරි වළලු පය නො    ලා

සුර කුමරුවො පෙළ සැ    දී
අතින් හිසින් රඟ යෙ    දී
හඟවති තාලය බැ    දී
වීණා බෙර නද නො    දී

සඳ ද සිනිඳු රැස් ක    ඳු
නො හෙළා බිම එක බ    ඳු
වලා කුළින් පිරිසු    ඳු
පෙරා එවයි බිඳු බි    ඳු

**මුනිදාස කුමාරණතුංග**

**සිංහල කාව්‍ය සංග්‍රහය** - 1958

- **මෙම පද්‍ය පන්තියෙහි ප්‍රධාන තේමාව හැටියට සැලකිය හැක්කේ කුමක් ද?**
- **මෙම නිශ්ශබ්දතාව පිළිබඳ සිත්තම ගොඩ නඟා ඇති අයුරු පරීක්ෂා කරන්න.**
- **කවියා නිශ්ශබ්දතාව සම්බන්ධයෙන් දක්වන ආකල්පය කුමක් ද?.**
- **හැඟීම් ජනනය කිරීම සඳහා භාවිත කොට ඇති උපක්‍රම පරීක්ෂා කරන්න.**

1 (ආ)

මැටි ගොඩක් වැනි කුඩා කඳුගැටයක් උඩ පිහිටි ගරු වැටුණු ලොකු ගෙයි පිට බිත්තිවල පමණක් නොව, ඇතුළු බිත්තිවල ද පුස් බැඳීමෙනුත් දූලි කුණු තැවරීමෙනුත් සැදුණු ලොකු පැල්ලම් බහුල ය. ගඟට මුහුණ පා පිහිටි ඒ ගෙයි මිදුල කෙළවර වන්නේ ක්‍රමයෙන් පාත් වීගෙන ගොස් දියට බැසීමෙනි. නදිය පිසගෙන හමන සුළඟින් නිතර තෙතමනය ලබන ඒ ගෙයි බිත්ති, පුස් බැඳීමෙන් ගරු වැටෙනු වැළැක්විය හැක්කේ අඩු ගණනේ අවුරුද්දකට වරක් හුනු පිරියම් කරවීමෙනි. සැමියා මළ ස්ත්‍රියක වන කළුතර හාමිනේ හත්අට අවුරුද්දකට වරකුදු ඒ ගෙයි හුනු ගෑවීමට තරම් වත්කම ඇති එකියක් නොවූවා ය.

කළුතර හාමිනේගේ ගෙට දකුණු පැත්තෙහි අලුත තනවන ලද ගෙවල් තුනක් වෙයි. පොල් ගසින් හා දෙල් ගසින් ද සෙවණ වුණු ගමෙහි උතුරු පැත්තෙහි රැප්පාවල පිහිටි පැරණි ගෙවල් හා පැල්පත් රාශියකි. මීට අවුරුදු කිහිපයකට පෙර දකුණු පැත්තෙහි ද වූයේ ගරු වැටුණු ගෙවල් හා දිළිඳු ගැමියන්ගේ පැල්පත් ද පිහිටි රැප්පා ය. පොල් ගස් හා දෙල්ගස් කැප්පවීමෙන් මෑතදී එළිමහන් පෙදෙසක් කරන ලද එහි ප්‍රීතියෙන් සිනාසෙන තරබාරු ගැහැනුන් වැනි අලුත් ගෙවල් දක්ක හැකි ය.

ගඟට පිටු පා පිහිටි අර ගරු වැටුණු ලොකු ගෙයි වෙසෙන තුසෙන් නෝනා, 'කළුතර හාමිනේ' යන නමින් හඳුන්වනු ලබන්නේ, ගැමියන් විසිනි. ඇගේ ළඟ නෑයන් ඇ හඳුන්වන්නේ 'තුසෙන් අක්කා' 'තුසෙන් නැන්දා' යන නම්වලිනි.

වෙන දා නිදිවරන්නන් මෙන් කටයුතු කරන කළුතර හාමිනේත් ඇගේ වැඩි විය පැමිණි දූවරු දෙන්නාත් දොළොස් හැවිරිදි පුතාත් මෙදින උදේ ක්‍රියා කෙළේ ගිනි නැවක වැඩ කරන්නන් ලෙසිනි. සේපාලිකා වහ වහා මිදුල අතු ගා දවස් ගණනක් තිස්සේ එහි එකතු වී තුබුණු දෙල් කොළ, කොස් කොළ, බකිණි කොළ, බිලිං කොළ, දෙළුම් කොළ, එකතු කොටගෙන ගොස් ගෙයි පිටිපස කඳු පාමුල වළක දමයි. මාලිනී ඉස්තෝප්පුවත් ගෙයත් පරණ කොස්සෙන් අතු ගා අලුත් කොස්සෙන් බිත්ති පිසදමයි. කළුතර හාමිනේ ගෙට දිව ගොස් පියදාස ලවා පුටු පිසදම්මන්ට වූවා ය. මඳ වේලාවකින් ඇ යළිත් ඉස්තෝප්පුවට දිවැවිත් 'දුව, සේපාලිකා ඉක්මන් කරපන් තව වැඩ තියෙනවා' යි කියමින් හාන්සි පුටුවෙහි හිස වසා මල් මැහුමින් අලංකාර කරන ලද රෙදි කඩක් දැම්මා ය. සාලයෙහි ලොකු කළුවර ලී කවිච්චියෙහි තුබුණු පැදුරු කබල් හකුළා කුස්සිය අසල වූ පාලු කාමරයක දමා, ගෝනි කුලිච්චම වසා චිත්ත රෙද්දක් අතුළා ය. එක් කාමරයක වූ පබලියමෙහි ගෝනි කුලිච්චම වසා කදිම සෝමනක් අතුට කුඩා ඇඳන් දෙකින් එකක අලුත් පැදුරක් ද අනිකෙහි චිත්ත රෙද්දක් ද අතුළා ය.

**මාර්ටින් වික්‍රමසිංහ**, **හඳ සාක්කි කිම**, - 1959

- මෙම ඡේදයෙන් එහි ඇතුළත් ප්‍රධාන චරිතය පිළිබඳව කවර තොරතුරු කියැවේ ද?
- හැඟීම් ජනනය කිරීම සඳහා ලේඛකයා භාවිත කරන භාෂාව හා රචනෝපක්‍රම පරීක්ෂා කරන්න.
- මහ ගෙදර ප්‍රබල සංකේතයක් වශයෙන් භාවිත කොට ඇති අයුරු පිරික්සන්න.
- මේ වර්ණනය ඔබගේ සිත් ගනී ද? ඔබේ නිගමනයට හේතු දක්වන්න.

---